
# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

**2023 ඔක්තෝබර්**
**05 වෙළුම 10 නිකුතුව**


## විශේෂ සිදුවීම්





2023 වසරේ ඔක්තෝබර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 928 දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.8කින් පහළ ගියේය.

2023 වසරේ ඔක්තෝබර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,610ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 20.6කින් ඉහළ ගියේය.





2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම සියයට 10.3කින් පහළ ගිය අතර ආනයන වියදම ද සියයට 9.6කින් පහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 284ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 683ක හිඟයක් වාර්තා කළේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - ඔක්.)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ඔක්.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - ඔක්.)





2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී, කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජමය ආදී වූ සියලුම ප්‍රධාන කාණ්ඩයන්හි අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම පහළ ගියේය.


2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 1.6කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 11.7ක පහළ යෑමක් වාර්තා කළේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී, ප්‍රධාන වශයෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත, මුහුදු ආහාර සහ ස්වභාවික රබර් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම කාලපරිච්ඡේදය තුළ තේ, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම් ඉහළ යෑමක් සිදුවිය.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය. තව ද, රබර් නිෂ්පාදිත, බනිජතෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, දැව සහ කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායමෙහි කැපී පෙනෙන පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ඔක්.)





### ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. - ඔක්.)





පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුන ද, අන්තර් සහ ආයෝජන භාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, සලකා බලන කාලය තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 1.3කින් ඉහළ ගිය අතර ආනයන මිල දර්ශකය සියයට 10.8කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (සහල්) ආනයන වියදම පහළ ගිය ද, සීනි සහ මේද හා තෙල් වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාස වල දී බොරතෙල් ආනයනය කර නැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ තිරිඟු, පොහොර සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - ඔක්.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසාන වන මාස දහය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

[Public]



# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ඔක්. 2022 | ඔක්. 2023 | වෙනස (%) | ජන. -ඔක්. 2022 | ජන. - ඔක්. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **225.6** | **199.7** | **-11.5** | **2,165.3** | **2,145.1** | **-0.9** |
| එයින් | තේ | 108.7 | 95.6 | -12.0 | 1,045.8 | 1,085.9 | 3.8 |
| | පොල් | 37.9 | 28.5 | -24.7 | 351.8 | 284.9 | -19.0 |
| | කුළුබඩු | 36.4 | 32.2 | -11.4 | 310.4 | 330.7 | 6.5 |
| | මුහුදු ආහාර | 19.6 | 20.3 | 3.6 | 224.9 | 213.2 | -5.2 |
| **කාර්මික අපනයන** | | **820.9** | **723.4** | **-11.9** | **8,832.4** | **7,721.3** | **-12.6** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 443.5 | 354.2 | -20.1 | 5,020.7 | 4,042.8 | -19.5 |
| | රබර් නිෂ්පාදිත | 82.9 | 78.2 | -5.7 | 838.0 | 746.8 | -10.9 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 37.8 | 51.6 | 36.3 | 477.7 | 422.9 | -11.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.5 | 47.0 | 22.0 | 444.3 | 444.7 | 0.1 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 53.9 | 47.0 | -12.8 | 481.8 | 512.5 | 6.4 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 42.5 | 45.3 | 6.6 | 379.1 | 439.6 | 16.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.3 | 5.6 | -32.7 | 71.9 | 60.6 | -15.6 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.1** | **4.9** | **-3.9** | **45.8** | **43.4** | **-5.3** |
| **මුළු අපනයන** | | **1,051.6** | **928.0** | **-11.8** | **11,043.5** | **9,909.8** | **-10.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ඔක්. 2022 | ඔක්. 2023 | වෙනස (%) | ජන. -ඔක්. 2022 | ජන. - ඔක්. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **202.1** | **263.4** | **30.4** | **2,348.8** | **2,506.0** | **6.7** |
| **ආහාර හා පාන වර්ග** | | 119.2 | 141.3 | 18.5 | 1,347.0 | 1,407.8 | 4.5 |
| එයින් | එළවළු (ආ) | 24.1 | 25.9 | 7.6 | 273.8 | 297.2 | 8.5 |
| | සහල් | 19.0 | 0.7 | -96.5 | 273.5 | 14.8 | -94.6 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 82.8 | 122.2 | 47.5 | 1,001.8 | 1,098.2 | 9.6 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 42.4 | 52.3 | 23.1 | 434.4 | 563.6 | 29.7 |
| **අන්තර් භාණ්ඩ** | | **945.2** | **1,085.2** | **14.8** | **10,442.6** | **9,190.5** | **-12.0** |
| එයින් | ඉන්ධන | 396.5 | 495.3 | 24.9 | 4,090.9 | 3,971.6 | -2.9 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 230.6 | 224.2 | -2.8 | 2,637.8 | 1,984.8 | -24.8 |
| | පොහොර | 18.6 | 12.8 | -31.1 | 123.1 | 174.6 | 41.8 |
| | තිරිඟු හා ඉරිඟු | 26.5 | 32.8 | 24.0 | 215.0 | 296.9 | 38.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **188.4** | **261.9** | **39.0** | **2,629.5** | **2,237.4** | **-14.9** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 127.3 | 168.7 | 32.6 | 1,698.0 | 1,524.4 | -10.2 |
| **මුළු ආනයන** | | **1,335.7** | **1,610.5** | **20.6** | **15,420.9** | **13,933.8** | **-9.6** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ඔක්. 2022 | ඔක්. 2023 | වෙනස (%) | ජන. -ඔක්. 2022 | ජන. - ඔක්. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -284.1 | -682.5 | | -4,377.4 | -4,024.0 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ඔක්. 2022 | ඔක්. 2023 | වෙනස (%) | ජන. -ඔක්. 2022 | ජන. - ඔක්. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 146.4 | 129.2 | -11.8 | 153.7 | 137.9 | -10.3 |
| | පරිමා දර්ශකය | 174.9 | 169.1 | -3.3 | 164.5 | 167.0 | 1.6 |
| | මිල දර්ශකය | 83.7 | 76.4 | -8.7 | 93.5 | 82.6 | -11.7 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 119.5 | 144.1 | 20.6 | 138.0 | 124.7 | -9.6 |
| | පරිමා දර්ශකය | 117.5 | 144.5 | 23.0 | 127.2 | 128.8 | 1.3 |
| | මිල දර්ශකය | 101.7 | 99.8 | -1.9 | 108.5 | 96.8 | -10.8 |
| **වෙළඳ මිල අනුපාතය** | | 82.3 | 76.6 | -6.9 | 86.2 | 85.3 | -1.0 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද